දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 23/2013

මගේ අංක :කේ5/5/විවිධ/ /2013
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2013.06.17 වන දින .

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත .

**බන්ධනාගාර තුලට පැමිණෙන ජේලර් වරුන් පරික්ෂා කිරීම**

බන්ධනාගාර ආයතන නිරතුරුවම සෝදිසියට ලක්කලද නීති විරෝධී ද්‍රව්‍යයන් බන්ධනාගාරයන් තුල ඇති බවට විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය මගින් නිරන්තරයෙන් ප්‍රචාරය වේ .එමගින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව පිළිබඳව අප්‍රසාදය මහජනයා තුල ගොඩනැගීමට හැකියාවක් ඇත .ගෞරවාන්විත රාජකාරි කරනු ලබන බන්ධනාගාර නිළධාරින් මෙමගින් අධෛර්‍යමත්වීම හා ඔවුන්ගේ අභිමානය බිඳවැටීමක් ද සිදුවේ .

දැනට බන්ධනාගාර ආයතන තුලට ඇතුළුවන ජේලර් ශ්‍රේණියට පහල නිළධාරින් පමණක් සෝදිසියට ලක්කරන අතර ඉන් ඉහල ශ්‍රේණිවල නිළධාරින් සෝදිසියට ලක්කිරීමක් සිදුනොවේ මේ අනුව එක් පාර්ශ්වයකට පමණක් චෝදනා එල්ලවීමක් සිදුවිය හැක .

එබැවින් මින් ඉදිරියට රාජකාරි කටයුතු සඳහා බන්ධනාගාරයන්ට හා බන්ධනාගාර රෝහලට ඇතුලත්වන සියළුම ජේලර් වරුන් , සුහසාධක නිළධාරින් හා වෛද්‍ය නිළධාරින් තමන් විසින් බන්ධනාගාර තුලට යාමේදී ස්වේච්ඡාවෙන්ම තම සන්තකයේ ඇති භාණ්ඩ දොරටු භාර නිළධාරියා වෙත භාරයාකාරව ඉදිරිපත් කිරමෙන් අනතුරුව බන්ධනාගාරය තුලට යායුතු ලෙසට දන්වා සියළුම ජේලර් වරුන් , සුහසාධක නිළධාරින් සහ වෛද්‍ය නිළධාරින් දැනුවත් කරන ලෙසටත් එසේ ස්වේච්ඡාවෙන් කටයුතු නොකරන නිළධාරින් අනෙක් නිළධාරින් සේ සලකා දැඩි පරික්ෂා කිරීම් වලට ලක්කල යුතු අතර එසේ සිදුකරනු ලබන පරික්ෂාවට ලක්වන නිළධාරින්ගේ විස්තර වහාම මාවෙත දන්වන ලෙස දන්වා සිටිමි . ඒ අනුව කිසිම නිළධාරියකු පරික්ෂා කිරීමකින් තොරව බන්ධනාගාර තුලට ඇතුල්වීමක් සිදු නොවනු ඇත . ඉහත නියෝග තරයේ පිළිපදින ලෙසට හා නිළධාරින් දැනුවත් කරන ලෙසට ඔබට මෙයින් දන්වා සිටිමි .( මේ සම්බන්දයෙන් ඔබ බන්ධනාගාරයේ සිටින සියළුම නිළධාරින් අධිකාරි නියෝගයක් මගින් දැනුවත් කිරීමට කටයුතු කල යුතුය )

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්